# මිරිස් වෙළෙඳ පොල

ලංකාවේ සම්ප්‍රදායික කුළුබඩු විශේෂයක් වශයෙන් වියළි මිරිස් වලට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. මෑතකදී කරන ලද පාරිභෝගික සමීක්ෂණයන් අනුව, ලංකාවේ පවුලක ආහාර සඳහා වැය වන මුළු වියදමෙන් සියයට 9ක්ම වැය වන්නේ වියළි මිරිස් සඳහා දීමෙන් එය මොනවට පැහැදිලි වෙයි. එමෙන්ම වියළි මිරිස් වල ඒක පුද්ගල පරිභෝජනය වසරක් සඳහා කිලෝ ග්‍රෑම් 1.94ක් වන හෙයින් එම ප්‍රමාණය පදනම් කරගත් විට ලංකාවේ වසරක් සඳහා අවශ්‍යවන වියළි මිරිස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 31000ක් පමණ වේ. ඊට අමතර වේ ස්වාරක්ෂක තොග (Buffer Stock) සඳහාද වසරකට මෙට්‍රික් ටොන් 7000ක් පමණ අවශ්‍ය වන හෙයින් වසරකට මුළු වියළි මිරිස් අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 38000ක් පමණ වේ. පසුගිය වර්ෂ 7ක පමණ වියළි මිරිස් නිෂ්පාදන සංඛ්‍යාවන් ගෙන බැලීමේදී වසරක සාමාන්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 24000ක් පමණ වන හෙයින් සෑම වසරක් පාසාම මෙට්‍රික් ටොන් 8000-10000ක් අතර ප්‍රමාණයක් විදේශ රටවලින් ලංකාවට ගෙන්වා ඇත. මේ නිසා දළ වශයෙන් වසරකට රුපියල් දශලක්ෂ 200-250 අතර ප්‍රමාණයක් මිරිස් ආනයනය සඳහාද වැය කිරීමට සිදුවී ඇත.

**නිෂ්පාදනය :**

ශ්‍රී ලංකාවේ මිරිස් නිෂ්පාදනය කරන ප්‍රධාන ප්‍රදේශ වශයෙන් යාපනය, කලාවැව, මාතලේ පොලොන්නරුව, අනුරාධපුරය හා අම්පාර යන දිස්ත්‍රික්කයන් දැක්විය හැක. 1985 යල කන්නයේදී මෙරටේ මිරිස් අවශ්‍යතාවයෙන් තුනෙන් එකක් නිපදවන මහවැලි 'එච්' කලාපය (කලාවැව නිෂ්පාදන ක්‍රියාවලියේදී පැහැදිලි සංවිධානාත්මක ස්වරූපයක් ද ගත්තේය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි ආර්ථික ඒජන්සිය, හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතන වල තිබූ මනා සම්බන්ධීකරණය මිරිස් වගාවේ සාර්ථකත්වයටම හේතු විය. නිසි කලට වේලාවට අවශ්‍ය පොහොර, බීජ, දැනුම හා අනෙකුත් උපදෙස් නොඅඩුව ලැබීමෙන් එහි සාර්ථකත්වය අවශ්‍ය අඩිතාලම වැටුණි. මෙම ආයතන තිහිපයේ මූලිකත්වයෙන් 1985 යල කන්නය සඳහා කලාවැව ප්‍රදේශයට පමණක් සීමා වූ නිෂ්පාදන සැලැස්මක් (Production Plan) ද අනුගමනය කරනු ලැබීය. එහිදී විශේෂඥයන් ප්‍රදේශයේ තිබෙන ආර්ථික හා මානුෂික සම්පත්, වාරිමාර්ග ජල පහසුකම්, දේශගුණික තත්ත්වයන්, පසෙහි ස්වභාවය, විශේෂිත බීජ හා පොහොර වැනි යෙදවුම් ආදී විවිධ සම්පත් පිළිබඳ පැහැදිලි අධ්‍යයනයක් කරමින්, මිරිස් වගාව සඳහා හෙක්ටයාර් 7000කට ආසන්න ප්‍රමාණයක් යොදා ගැනීමටද එමගින් වියළි මිරිස් මෙට්‍රික් ටොන් 10000ක් නිෂ්පාදනය කිරීමටද ඉලක්ක කර ගන්නා ලදී. මෙම නිෂ්පාදන ඉලක්ක ලබා ගැනීම සඳහා පසුගිය යල (1985) කන්නයේදී කලාවැව ප්‍රදේශයේ පමණක් මිරිස් වගා කළ බිම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මිරිස් වගාකල මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 38කට ආසන්න ප්‍රමාණයක් බව කිව හැක. මේ අන්දමින් ප්‍රාදේශීය විශේෂීකරණය (Regional Specialization) යටතේ ප්‍රදේශයේ සම්පත් උපරිම අන්දමින් යොදා ගැනීමට හැකිවන අයුරින් ඒ ඒ සම්පත් වල කාර්යක්ෂමතාවය ඉහල නංවාලන අන්දමේ වැඩ පිළිවෙලක් දියත් කිරීම ඇත්තෙන්ම මුළු මහත් ශ්‍රී ලංකාවටම ආදර්ශයකි.

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී,
ඩබ්ලිව්. ජී. සෝමරත්න
— විසිනි —

මෙම ප්‍රාදේශීය විශේෂීකරණ වැඩ පිළිවෙල නිසා මේ වනවිට කලාවැව ප්‍රදේශය ක්‍රියාත්මක වශයෙන් "මහවැලි මිරිස් කලාපය" බවට පත්වී ඇත. මෙසේ දියත් කරන ලද නිෂ්පාදන සැලැස්මෙහි නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමේදී විශේෂඥයන් අපේක්ෂිත බිම ප්‍රමාණය ඒ සඳහා යෙදවීමත් ඉන් නිෂ්පාදන ඉලක්කයන් ලබා ගැනීමත් සියයට 90කින් පමණ ඉටු කර ගෙන ඇති බව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලිව පෙනේ.

තව දුරටත් සලකා බැලුවහොත් කලාවැව ප්‍රදේශයේ පවතින රතු දුඹුරු පසෙහි විශේෂිත ස්වභාවයක්, ජලය අඩුවෙන් වැයවන භෝග

වගා කිරීමත් ගැන සලකා බලන විට මිරිස් එම ප්‍රදේශයට සුදුසු තම වගාවක් බවට පත්වේ. අනෙක් අතින් යල කන්නයේදී, මේ ප්‍රදේශයේ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 95%ක පමණ මිරිස් වගා කරනු ලබන්නේ වාරිමාර්ග ජලය හොඳ ගෙන යල කන්නයේදි වැඩි ප්‍රමුඛතාවයක් වී වගාවට වඩා මිරිස් වගාවට ලැබේ. මෙම තත්ත්වයන් නිසා කලින් ව්‍යාපාරික වගාවක් වශයෙන් මිරිස් වගාකළ යාපනය හා වවුනියා යන දිස්ත්‍රික්ක වෙනුවට කලාවැව ප්‍රදේශය මේ වන විට ව්‍යාපාරික වගාවක් වශයෙන් මිරිස් වගාකරන ප්‍රධානතම ප්‍රදේශය බවට පත් වී ඇත.

මෙම තත්ත්වය යටතේ ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වල ගොවීන්ට වඩා මහවැලි ප්‍රදේශයේ ගොවියන් ඇත්තෙන්ම ව්‍යාපාරික වශයෙන් මිරිස් නිෂ්පාදනයට හවුල්වීම පැසසිය යුතුව පවතී. මෙම මිරිස් වගාව සඳහා 1983 වියදම් රටාවන් අනුව හෙක්ටයාරයක් සඳහා මුළු නිෂ්පාදන වියදම රු. 17000/- -18000 අතර ප්‍රමාණයක්වේ. එහෙත් පසුගිය යල් කන්නයේදී මෙම ප්‍රදේශයේ ගොවින් හෙක්ටයාරයකින් ලබන ලද අස්වැන්න අලෙවියෙන් දළ වශයෙන් රුපියල් 40000/-ක් පමණ ලබා ගැනීමෙන් වාර්තාගත ආදයමක් මිරිස් වගාවෙන් ලබාගත හැකි බව පෙන්වා ඇත. මෙම ප්‍රදේශයේ ගොවියන් හෙක්ටයාරයක වී වගාවෙන් ලබන ආදායම වන රු. 12000- රු. 13000 හා මිරිස් වලින් ලබන ආදායම් හා සසඳා බලන කල මිරිස් ආදායම ඉතා ඉහල මට්ටමක පවතින හෙයින්ද මිරිස් වගාව සඳහා ගොවීන්ගේ කැමැත්තෙහි වැඩවීමක් පවතින හෙයින්ද එය නිෂ්පාදනයේ වර්ධනයකට ද හේතුවිය හැක.

**අලෙවිකරණය :**

ලංකාවේ වියලි මිරිස් අලෙවිකරණය, ප්‍රධාන වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ තරඟකාරිත්වයෙන් මෙහෙයවෙන කාර්යයක් වී ඇත. විශේෂයෙන් සුළු ගොවියාගේ ගොවිපලේ මිරිස් මිළ තීරණය සඳහා සෑම කන්නයක් පාසාම රජය මගින් අවම මිලක් (Floor Price) තීරණය කිරීම 1980 වර්ෂයේ පටන් නොකඩවා කරගෙනයිත් ඇත. එම අවම මිල තීරණය කිරීම සඳහා වන නිෂ්පාදන වියදම්, පවත්නා මිල ගණන් තොග මට්ටම්, ස්වාරක්ෂක



තොග වෙළෙන්දා විසින් එළවලු ප්‍රවාහනය කරන අවස්ථාවක්

*

තොග (Buffer Stocks) පිළිබඳව සැලකිල්ලට ගැනේ. මේ නිසා විවෘත වෙළඳපලේ මිල තීරණය සඳහා සෑම විටම පෞද්ගලික අංශය මෙම අවම මිල පදනම් කර ගනිමින් තරඟකාරිත්වයක් රාජ්‍යය අංශය හා ඇති කරන අතර, ඒනිසා සෑම අවස්ථාවකදීම පෞද්ගලික අංශය අවම මිලට වඩා වැඩි මිළක් සුළුගොවියාට ලබා දෙයි.

පසුගිය වසර කීපය තුල වෙළඳපලේ මිරිස් මිල ගණන්වල හැසිරීම පිළිබඳව සලකා බලන විට දෙසැම්බර් මාසයේ සිට අප්‍රියෙල් මාසය දක්වා වන කාලයන් තුලදී මිල මට්ටම් ඉහල මට්ටමක පවතින බවත් අනෙකුත් කාලයන් එනම් මාර්තු සිට නොවැම්බර් මාසය දක්වා වූ කාලය තුලදී (අගෝස්තු හැර) මිල මට්ටම් පහල මට්ටමක පවතින බවත් පැහැදිලිව පෙන් වයි. එය පහත සඳහන් සිල්ලර මිල ගණන් පිළිබඳ දර්ශකයෙන් මනාව පැහැදිලි කරවයි.

සාමාන්‍ය තත්ත්වයන් එසේ වුවද විශේෂයෙන් 1985 යල කන්නයේදී ගොවියාගේ ගොවිපලෙන් මිලදී ගැනීමේ සිට පාරිභෝගිකයන්ගේ මිරිස් අවශ්‍යතා සැපයීම දක්වා වන අලෙවිකරණ කටයුතු වලදී එතෙක් පැවැති පෞද්ගලික අංශය හා තරඟයට සමුපකාර තොග වෙළඳ සංස්ථාව ද එකතු වීම ඇත්තෙන්ම නව මගක් ගත් බව පෙනේ. මේ තත්ත්වය නිසා එතෙක් වියලි මිරිස් සඳහා ගොවිපලේ පැවැති මිල (Farm Gate Price) කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 23/- සිට රුපියල් 27/- දක්වා ඉහල යාමක් විශේෂයෙන් අනුරාධපුර, මාතලේ පොළොන්නරුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක යන්හි දක්නා ලදී. එයට හේතු වූයේ සමුපකාර තොග වෙළඳ සංස්ථාව මිලදී ගන්නා මිරිස් සඳහා ගොවිපලේදී ම කිලෝවක් සඳහා රුපියල් 27/-ක් ගෙවීමයි.

**සිල්ලර මිල දර්ශකය (වියලි මිරිස් සඳහා)**

**සාමාන්‍ය මිල - 100**

| මාසය | දර්ශක අංකය | මාසය | දර්ශක අංකය |
|---|---|---|---|
| ජනවාරි | 101.60 | ජූලි | 93.59 |
| පෙබරවාරි | 113.45 | අගෝස්තු | 102.90 |
| මාර්තු | 115.01 | සැප්තැම්බර් | 92.35 |
| අප්‍රේල් | 111.62 | ඔක්තෝබර් | 91.05 |
| මැයි | 93.06 | නොවැම්බර් | 95.32 |
| ජූනි | 89.45 | දෙසැම්බර් | 100.65 |

**මූලාශ්‍රය :** අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය-ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

මේ අනුව දෙසැම්බර් සිට අප්‍රේල් දක්වා වන කාලයේදී විශේෂයෙන් යල අස්වැන්න අවසන්වීමත් අනෙක් අතින් විවිධ උත්සව අවස්ථාවන් සහ ඉල්ලුමේද යම් ප්‍රමාණයක වර්ධනය වීම ද මිල ඉහල මට්ටමක තැබීමට හේතු වේ.

**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (C.W.E.) නව වියලි මිරිස් අලෙවි ක්‍රමය :**

මෙම ගොවිපලේ මිළ ගණන් ඉහල යෑමේ අනිවාර්ය ප්‍රතිඵලය වූයේ පෞද්ගලික අංශයේ පැවති තරඟකාරිත්වය නිසා පෞද්ගලික අංශයට ද ගොවිපලෙන් මිලදී ගන්නා මිරිස් සඳහා වැඩි මිළක් ගෙවීමට සිදු වීමයි. එහිදී කලාවැව ප්‍රදේශයේ සුළු මිරිස් නිෂ්පාදකයාට පෙරට වඩා වැඩි ආදයමක් විශේෂයෙන් පසුගිය යල්, කන්නයේදී ලබා ගැනීමට හැකි විය. මේ අනුව කලාවැව මිරිස් ගොවීන් පසුගිය යල් කන්නයේදී රටට අවශ්‍ය මිරිස් වලින් 1/3 ක ප්‍රමාණයක් සපයා රුපියල් දශලක්ෂ 250 කට

වඩා වැඩි ආදායමක් මෙම සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ නව අලෙවි ක්‍රමය මගින් හා පෞද්ගලික අංශය මගින් කරන ලද අලෙවිය මගින් ලබාගෙන තිබීම මෙම නව අලෙවි ක්‍රමයේ සාර්ථක භාවය මනාව පෙන්වයි.

මෙම නව මිරිස් මිලදී ගැනීමේ ක්‍රමය යටතේ අනුරාධපුර, මාතලේ, පොලොන්නරුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි මිරිස් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 40කට ආසන්න සංඛ්‍යාවක් දැනටම පිහිටුවා ඇති අතර ඉදිරියේදී මෙම ප්‍රමාණය 50 දක්වා වැඩි කිරීමට අපේක්ෂා කර ඇත. එමෙන්ම මේ යටතේ 1985 යල් කන්නයේදී වියලි මිරිස් මෙට්‍රික් ටොන 6000ක් මිලදී ගැනීමට ඉලක්ක කර ඇති අතර 1985 සැප්තැම්බර් අවසානය වනවිට මෙයින් 1/4ක් පමණ මෙම මධ්‍යස්ථාන මගින් මිලට ගෙන ඇත ඒ අනුව රුපියල් දශලක්ෂ 45ක් පමණ මිරිස් මිලදී ගැනීමෙන් පමණක් සුළු ගොවීන් අතරට ස. තො. ස. මගින් ලබා දී ඇත. විශේෂයෙන් කලාවැව ප්‍රදේශය තුල පමණක් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 18ක් පිහිටුවා ඒ මගින් ස. තො. ස. මිලදී ගත් මුළු මිරිස් ප්‍රමාණයෙන් 50% කට වඩා එකතු කර ගැනීමට හැකිවීමද ප්‍රාදේශීය විශේෂීකරණයේ වැදගත්කම මොනවට පැහැදිලි කරයි.

එමෙන්ම සතොස මගින් මනා තත්ත්ව පාලනයක් යටතේ හොඳ තත්ත්වයෙන් යුත් වියලි මිරිස් වෙළඳපලට සැපයීමට කටයුතු කර ඇත. ඒ සඳහා විශේෂිත "සංචිත ගබඩාවක්" පිහිටුවා ඇති අතර එමගින් ඉහත දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති මධ්‍යස්ථානවල එකතු කරන මිරිස් වර්ගීකරණය, වියලීම, ඇසිරීම හා අදල අනෙකුත් සැකසීම් කටයුතු තත්ව පාලක වරයෙකුගේ අධීක්ෂණය යටතේ කරනු ලබයි. එමගින් පාරිභෝගිකයාට හොඳ තත්ත්වයේ වියලි මිරිස් ලබා ගැනීම පහසු කර ඇත.

මෙම නව ක්‍රමය යටතේ සුළු ගොවියාගේ කිනම් තොගයකට වුවද මිරිස් සැපයූ අවස්ථාවේදීම මුදල් ලබා දිමත් කරන හෙයින් කිසිම අවදානමකට හෝ මුදල් ලබා ගැනීමේ කාල පමාවකට ඔවුන්ට මුහුණ දීමට නොසිදුවන හෙයින් කලාවැව ප්‍රදේශයේ ගොවිජනාව අතර මෙම ක්‍රමය වඩාත් ප්‍රචලිතවී ඇත. තවද මේ යටතේ ස. තො. ස. මගින් මිරිස් මිලදී ගැනීම සඳහා රුපියල් දශලක්ෂ 168ක් වෙන්කර ඇති අතර මෙම මිරිස් එක්රැස් කිරීම නිසා ස. තො. ස ට අනාගත අවශ්‍යතාවයන් සඳහා තොග පවත්වා ගැනීමේදී ආනයන කිරීමකින් තොරවී දේශීය මිරිස් තොග වලින්ම පවත්වා ගත හැකි නිසා ඒ අනුව ද රුපියල් දශලක්ෂ 180ක් ඉතිරි කර ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

මෙම තත්ත්වයන් යටතේ ප්‍රාදේශීය විශේෂීකරණයක් ලෙස එක් අතකින් නිෂ්පාදනයත්, අනිත් අතින් අලෙවිකරණයත් ක්‍රමවත්ව සංවිධානය වී තිබීමෙන් තවදුරටත් පෞද්ගලික අංශය හා ඇතිකළහැකි තරඟකාරීත්වය තුලින් සුළු ගොවියාට වැඩි ආදායමක් ලබා ගැනීමට හැකිවී ඇත. එමෙන්ම ස. තො. ස. මගින් ඇති කරන ලද මෙම ක්‍රමය නිසා කලාවැව සුළු මිරිස් ගොවියාට පැහැදිලිවූත් ස්ථාවරවූත් වෙලඳපලක් ලබා ගැනීමට හැකිවීමෙන් සුළු ගොවි ආදායම් තත්ත්වය දියුණු වී ඒ මගින් ඔහුන්ගේ ජීවන තත්ත්වයන්ගේ දියුණුවක්, ඇතිවීමටත් එය රටේ සංවර්ධනයට සානුබලයක් වීමටත්, අනාගතයේදී හේතු විය හැක.

**නිගමන සහ යෝජනා :**

මෙසේ ක්‍රමවත් පරිදි වියලිමිරිස්, නිෂ්පාදනය ප්‍රාදේශීය මට්ටමෙන් සැලසුම් කිරීම රටටම ආදර්ශයක් වන අතර එමගින් වන නිෂ්පාදනයේ ඉහලයාම සහ ක්‍රමවත් පරිදි වන තත්ත්ව පාලනයේ වර්ධනය නිසා වියලි මිරිස් වලට විදේශ වෙලඳපලවල් පවා ලබා ගැනීමේ හැකියාව බොහෝ සෙයින් ඇත. එමගින් විදේශ විනිමය ඉපැයීමක් මෙන්ම නිෂ්පාදනයේ ඉහල යාමක් ද දක්නට පුළුවන.

අනෙක් අතින් රටේ පරිභෝජන ඉල්ලුමට සරිලන මිරිස් වර්ග නව සොයාගැනීම් මගින් ඇති කිරීම හා වැඩි නිෂ්පාදනයක් ලබාදෙන වර්ග ලබාදීම මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහාය වුවහොත් එයින් නව වෙලඳපලවල් සොයා ගැනීමට පහසුවක් වීමෙන්, වෙලඳපලට අවශ්‍ය භාණ්ඩය නිපදවීමට හැකිවීමෙන් වූ විශේෂ වාසි ලබාගැනීමට ද හැකි වෙයි.

තවදුරටත් සලකා බැලුවහොත් එකිනෙක වගාවන් සඳහා වන පරිදි සුළුගොවි සංවිධාන ගොඩනැගීමත් මේ තුලින් කළ හැකි නිසා, එමගින් වර්ගය, තත්ත්වය හා නිෂ්පාදන කාලය ආදිය පිළිබඳව උපරිම අන්දමින් යොද ගැනීමට හැකිවීමෙන් වඩාත් පහසු සේවයක් සැලැස්විය හැකිය. එමගින් වෙලඳපලට අවශ්‍ය භාණ්ඩය නිපදවීමට හැකි වීමෙන් වැඩි ආදායමක් ගොවියාට උපයා ගැනීමට හැකිය. එමෙන්ම දේශීය වෙලඳපලට අමතරව විදේශ වෙලඳපලක් සඳහාද මිරිස් නිෂ්පාදනය කිරීමට ගොවියාට හැකියාව ලැබීමෙන් මහවැලි මිරිස් කලාපය විදේශ වෙලඳපලවල් හා කෙලින්ම කටයුතු කරන තත්ත්වයට පත්වී රටේ සංවර්ධනයටද කිසියම් සානුබලයක් ලබා දීමට ඉදිරිපත් වේ යයි කිව හැක.